අප්පුහාමිගෙ හෑල්ල

මගේ යටි හිත කියනවා ආනන්ද සිව්රු ඇරියෙ නැත්නං හොඳයි කියලා.
''මොකද සිරියාවතී හාමිනේට එහෙම හිතුනෙ?''
''නිකමට හිතුනා. තව අව්රුදු හතරක් පහක් හිටියා නං නායක කමත් ලැබෙනවා. ලොකු හාමුදුරුවො දැං ඉන්නෙ ගොඩට පයයි - වලට පයයි වගේ.. පිලිකාව සනීප කරන්න බැරි ලු.'
''නායක කතාව තිබුනාවෙ. ඒක ඉතිං උබය විහාරාදිපති කමක් නෝ අපි කව්රුත් දන්නවා ආනන්ද මහන උනේ සසර කලකිරිලා නෙවි. ඒකට හේතු කීපයක් ම තියනවා. ප්‍රදාන හේතුව තමයි නායක හාමුදුරුවංගෙ ඉල්ලීම, නායක හාමුදුරුවංගෙ ඉල්ලීමට පිටු පාන්න සෝමාට පුලුවං කමක් තිබුනෙ නෑ. ඒකට හේතුව ඔහෙයි මායි විතරක් නෙවි මුලු ගමම දැනං හිටියා. අනෙක ඒ කාලෙ ආනන්ද විජය කුමාරයො වගේ නාහෙට අහන්නැති එකා. අපේ හේනෙමාමාගෙ දෝනියැන්දත් එක්ක මොකක්දෝ හුටපටයක් තිබුණු බව ඔහේට මතක නැහ්?
'ගිහි කමෙයි කියන්නෙ සොබහවික පිවිතේ. පැවිදි කම සොබහවික නෑ. ඒක නිසා නේ සමහර පැවිදි ඇත්තො සිව්රෙ ඉන්න ගමං ගිහිකං කරන්න ගිහිං අනුවෙලා තමංගෙ මූනෙ දැලි ගා ගෙන සාසනෙත් කැත කරන්නෝ අනෙක ඒ වගෙ එළිදරව් වෙන්නෙ සීයට එකක් වගේ බොහෝම සොච්චමක් නේ ඔහේට මතක ද ඕස්ටෙලියාවෙ - ලංකා පන්සලක හාමුදුරු නමක් ලංකාවෙ ක්‍රමේට එහේ බබලතුංගෙ පස් දොරේ ''තය්ලාලේප'' කරලා එහේ 'බන්දනාරාමෙක' අව්රුදු කීපයක් වැඩ වසන්න සීද්ද උනු කතාව. මෙහේ පත්තර කීපෙක ම පල වෙලා තිව්නා. 'කල එන්නා හා ම ගස නිසි ලෙස පීදේ' කියලා කියමන ඔහේ අහලා ඇති. සරු සාර පොලවක ඉර අව්ව ඇති තැනක ලෙඩක් නැතුව හැදෙන ගහ නියම කාලේට පීදෙනවා. සත්ත පීවිතෙත් ඒ වගේ. මනුස්සයත් සතෙක්. මහසත් - බෝසත් කියලා බුදුන්ටත් කියනවා නෝ
මං ඔහේ කැන්දං ආවෙ සබං ගාලා... පිට අතුල්ලලා නාවලා.. ලස්සන සාරියක් අන්දෝලා සැං පව්ඩර් ගාලා ලඟිං වාඩි කරගෙන හැඩ බල බල ඉන්න නෙවි නෝ ...
'ඕන්න... ඔන්න අප්පුහාමිගෙ කෝච්චිය පිලි පැන්නා..'
''පිලි පැන්නා? නෑ එහෙම එකක් උනේ නෑ. ඔහෙයි මායි දැං දරු මුනුබුරු හමුදාවක් ඉන්න සීයා කෙනෙකුයි ආත්තම්මා කෙනෙකුයි නේ. අපට හංගන්න දේවල් නෑ. ලැජ්ජා වෙන්න දේවලුත් නෑ. ඔහේ කාමරෙයි මං ඉස්තෝප්පුවෙයි නිදා ගත්තා නං... අපි ආ ගමන හරි ෟ නියමයි නෙහ්'
'හා පෝ ඇති ඇති දැං ඔබ දර්ම දේසනාව නැවැත්තුවානං ෟ කාස්සප බුදුං කාලෙ සිද්ද වෙච්ච දේවල් ඇදලා ගත්තා. අනේ අම්මාපල්... ''
'යට ගිය දේ.. ඉතිහාසෙ තරං ජීවිතේට අත්යාවස්ස දෙයක් වෙන නෑ. තමංගෙ යටගිය ජීවිතේ මතක් කර කර සමහරු හිනා වෙනවා. උදං අනනවා. හිත සන්තෝසෙං ඉන්න මිනිහාගේ මූන පෙම් පාටයි. ඇඟපත නිරෝගියි. මොලේ උන... ඉදිමිල්ල නෑ. හැම දෙනාටම ඒ වගේ හිනාවෙන්න පුලුවං අතීතයක් ඉතිහාසයක් නෑ, ඔව්ං තමංගෙ යටගියාව මතක් උනාම අඬනවා හුල්ලනවා. ආනන්ද ලමයා නිරෝගි කෙනෙක්. තරුන වයස. එයාට මහන කම ඇති වෙලා. හේතු අපි දන්නෑ. දැන ගන්න අවස්‍යතාවෙකුත් නෑ. තමං ලඟ නැති ගුන ඇති බව පෙන්න පෙන්න .... තමන්ට රකින්න බැරි සිල් අනුන් ලවා රක්කන්න වෑයං කර කර... ගිහි කමට තමනුත් ආස බව - කැමැත්ත වහං කර ගෙන, හිතට දුක් දිදී ලෝකයා රවට්ටන එක මහා පාපයක් ෟ මහ කැත වැඩක් ෟ
ඒ නිසා ඒ ලමයා ගත්තු තීරනේ හරියට ම හරි.''
''අනේ...ඒ...මන්දා... ඒ උනාට මහනකම උතුං කියලා කියන්නෝ''
'ඒ ගැන නං මං මොකුත් කියන්න දන්නෑ. මං ගිහියෙක්. ගිහි ජීවිතේට ආස කරන කෙනෙක්. බන පොතේ තියන හැටියට නං ඒ ගැන කතා කරන එකත් පව්. ඒ වගේ අදහස් හිතට එන්නේ මිත්‍යාදුස්ටිකයන්ට ලු. මං මොකටද ඒ 'ටානාන්තරේ' කරේ එල්ල ගන්නෝ හැබැයි සිරියාවතී හාමිනේ මේක මතක තියා ගන්න. හැම යතිවරයකුගෙ ම අම්මයි තාත්තයි ගිහියෝ. ගිහිකම හරියට කලහම දරුමල්ලෝ උපදිනවා. ඒ හින්දා ගිහිකම හෑල්ලු කරන එක හරි නෑ, ලෝකෙ පවතින්නෙ ගිහියො නිසා. මොකක් හරි හේතුවක් නිසා ගිහිකම් කරන්න අකමැති ගිහිකම් කරන්න බැරි ඇත්තො මහන වෙනවා. සමහරු ටික කාලෙකින් පැවිදිකම එපා වෙලා ගිහියො වෙනවා. ඒකෙ කිසිම කිසි වැරැද්දක් නෑ,
''ඔන්න ඔන්න අප්පුහාමි මහ පොලව පැලෙන්න එනවා වගේ''
''ඔව් ඔව් සුනාමියක් එන්නත් පුලුවං. එතකොට මැරෙන්නෙ පව්කාරයො විතරක් නෙවී කැඩෙන්නෙ පව් කාරයංගෙ ගෙවල් විතරක් නෙවි.
කොහොම උනත් ආනන්ද ගිහියෙක් වීම ගැන මට පස්වනක් ප්‍රීති.. නෑ.. නෑ. හරි ම සතුටුයි. සිව්රෙ මඩ ගා ගන්නැතුව සාසනේ කැත කරන්නැතුව කල වැඩේ හරියට ම හරි. අනෙක අපේ පක්සෙට චන්දයක් එකතුවීම කොච්චර දෙයක් ද? ආ.. ඒක නෙවි සිරියාවතී හාමිනේ හොඳට මතක තියා ගන්න සෝමලා මඟුල් කියන්න ආවා ම බොහෝ ම ඉහලිං ලෙංගතු කමිං පිලිගන්න ඕන. යටගිය දේවල් ගැන කතා ඇඳුනොත් ඒවා නෑහුනා වගේ ඉන්න.
''අපෙ අප්පෝ... මන්නෙමෙයි කටාරින්නෙ. ඕන්නං එදාට ගේට්ටුවෙ ඉබ්බා ගෙනත් තියන්නං. අප්පුහාමිට ඕන උනොත්.

(මෙය අපේ සිල්වත් නැනවත් පින්වත් යතිවරුන් ගැන නෙවේ.)

STANHOPE PRINTING
FOR OFFSET AND DIGITAL PRINTING
සිඩ්නි සහ මෙල්බර්න් ශ්‍රී ලාංකිකයනට කදිම අවස්ථාවක්
- Labels
- School Magazines
- News Letters
- Business Stationery
- Annual Reports
- Special Publications
- Posteres
- Brochures
- Greeting Cards
- Business Cards
- Flyers
- Price Lists

ALL YOUR PRINTING NEEDS....
ඔබගේ සියලුම මුද්‍රණ කටයුතු සඳහා පහත සඳහන් අංකයනට අමතන්න
මුද්‍රණ ඇනවුම් සඳහා තැපැල් ගාස්තුවලට අයකිරීමක් නොමැත
LAKSHMAN
TEL.(02) 9626 7660
MOB.0405287243



ලක්ෂ්මන් කොඩිතුවක්කු

නිදහස් සමරුව නිඩ්නි නුවරදී

ශ්‍රී ලංකාවට නිදහස ලබා වසර 58 පිරීම නිමිත්තෙන් පැවැති නිදහස් උත්සව උළෙල පසුගිය පෙබරවාරි මස 04 දා සිඩ්නි නුවර රෝස්ලි ප්‍රජා ශාලාවේදී අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණි.
ශ්‍රී ලංකාවේ ඕස්ට්‍රේලියානු තානාපති කුසුම්සිරි බාලපටබැඳිගේ මහතාගේ මූලිකත්වයෙන් සිඩ්නි නුවර කොන්සල් ජනරාල් කාර්යාලය සංවිධානය කර තිබූ මෙම උත්සවයට බොහෝ ශ්‍රී ලාංකික පිරිසක් සහභාගි වූ අතර, තානාපති, කොන්සල් ජනරාල්වරිය ඇතුළු විවිධ ජාතීන්ට අයත් ආගමික නායකයන් නිදහස පිළිබඳ විශේෂ දේශන පැවැත්වූහ. 2005 වසරේ උසස් පෙළ විභාගයෙන් සමත් වූ ලකුණු 98 කට වඩා ගත්, විශ්ව විද්‍යාල ප්‍රවේශයට තේරුණ, සිඩ්නිවාසී දරු දැරියනට ශ්‍රී ලංකා සංගමය මගින් තිළිණ ප්‍රධානය කිරීම මෙම උත්සවයේ කැපී පෙනෙන විශේෂත්වයක් වූ අතර, උත්සවය අවසානයේ සිඩ්නි නුවර සියලුම සංගම් එකමුතුව පැවැත්වූ විවිධ ප්‍රසංගය තුළින් මෙම නිදහස් උත්සවය තව තවත් විචිත්‍රවත් විය.

පිනා සහ වළං කඳ

සිඩ්නි නුවර වාසය කරන නාට්‍ය නිර්මාණකරුවෙකු වූ නිමල් වනිගසිංහගේ තිර පිටපතක් හා අධ්‍යක්ෂණයෙන් යුතුව, ජයලත් මනෝරත්න සහ නිරංජලා මංජරී ගී ගයන, තරුපති මුණසිංහ සංගීතවත් කළ වීරසේන රණහේවා, උපුල් පාදුක්ක විදාන, ශාන්ත වනිගතුංග, සමින්දු මාවලගේ, විමලේන්ද්‍ර කුමාරි, සම්පත් ජයවීරගේ රංගන දායකත්වයෙන් යුතුව ස්වාධීන නාට්‍ය සංගමය ඉදිරිපත් කරන, ජන කථාවට නව අරුතක් රැගත් ''පිනා සහ වළං කඳ'' ගීත නාටකය 2006 අප්‍රේල් මස 01 වෙනි සෙනසුරාදා සවස 3.30 ට හා 7.00 ට නෝරින් රයිඩ් හි මැක්වාරි විශ්ව විද්‍යාලයේ ලයිට් හවුස් රංග ශාලාවේ වේදිකා ගත වේ.

තනුජා ට ඔබේ ආධාරය දෙන්න

දරුණු රෝගාබාධයකින් පෙළෙන තනුජ ප්‍රනාන්දු දැරියට ප්‍රතිකාර කිරීම සඳහා අරමුදල් රැස් කිරීමේ රාත්‍රියක් මාර්තු 19 වන දා සවස පෙන්ට්හිල් හි සුනිල් ආට් කොන්ලිහි දී පැවැත්වෙයි. මෙයට සහභාගිවී ඔබේ ආධාරයත් ලබා දෙන්න.

රසිකට ඉක්මන් සුවය පතමු

සිඩ්නි නුවර වෙසෙන කවියෙකු ලේඛකයෙකු මෙන්ම සිංහල සංස්කෘතික හමුවේ සිංහල සඟරාවේ සංස්කාරක රසික සූරියආරච්චි මහතා හදිසියේ රෝගාතුර වී තවමත් ප්‍රතිකාර ගනිමින් සිටියි.
සන්නස ඔහුට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරයි

විදු සටහන් අභ්‍යවකාශය තාක්ෂණය

ග්‍රීන්ලන්තයේ වැඩි බිම් ප්‍රමාණයක් වසාගෙන ඇත්තේ ඝන හිම තට්ටුවලින්. මේ හිම තට්ටු (ග්ලැසියර්) ඉතා වේගයෙන් සාගරය දෙසට ගමන් කරමින් දියවී යන බව ඇමරිකාවේ ශාන්ත ලුවිස් නගරයට එක්රැස්වුණු විද්‍යාඥයන් පිරිසක් විශේෂ මාධ්‍ය හමුවකදී කියා තිබුණා.

බී.බී.සී. පුවත් සේවයේ විද්‍ය ප්‍රවෘත්ති වාර්තාකරුවකු වන පෝල් රින්කොන් මේ පිළිබඳව විශේෂ වාර්තාවක් එම පුවත් සේවයට ලබාදී තිබුණු අතර එය බොහෝ දෙනෙකුගේ සිත් තුළට බිය ගෙන දෙන තොරතුරුවලින් සමත්විත වුණා.

එම වාර්තාවට අනුව කියැවෙන්නේ පසුගිය කාලයේ නිර්ණය කර තිබුණු පරිදි නොව ඉතා වේගයෙන් ග්‍රීන්ලන්තයේ පිහිටි හිම තට්ටු දියවී එම ජලය මුහුදට එක්වනු ඇති බවයි. මීට පෙර එම ක්‍රියාවලිය සිදුවීමට වර්ෂ දහසක් පමණ කාලයක් ගතවනු ඇතැයි විද්‍යාඥයෝ විශ්වාසය පළකර තිබුණා. නමුත් දැන් ලැබෙන තොරතුරුවලට අනුව කියැවෙන්නේ එය ඊට වඩා ඉක්මණින් සිදුවනු ඇති බවයි.

මෙහි ඇති භයානකත්වය වනුයේ මුහුදු ජල මට්ටම ඉහළ යාම බවයි විද්‍යාඥයෝ පවසන්නේ.
අත්ලාන්තික සාගරයට ලිස්සා එන මෙම හිමතට්ටු පසුගිය පස්වසරට සාපේක්ෂව දෙගුණයක් වේගයෙන් දියවෙමින් යන බවයි පර්යේෂකයින් අනාවරණය කරන්නේ. මෙම ආකාරයට ග්‍රීන්ලන්තයේ පමණක් පිහිටි ඝන අයිස් තට්ටු සම්පූර්ණයෙන් දියවී ගියපසු මුහුදු ජලමට්ටම මීටර් හතකින් ඉහළ යනු ඇතැයි විද්‍යාඥයෝ පවසනවා.

වායුගෝලය උණුසුම්වීමත් සමගම එයට ක්ෂණිකව ප්‍රතිචාර දක්වන ග්ලැසියර වේගයෙන් දියවී යන බව පවසන විද්‍යාඥයෝ 1996 වසරේ පමණක් ග්‍රීන්ලන්තයේ කරන අයිස් තට්ටු ඝන කිලෝමීටර් 100 ක් දිය වී ගිය නමුත් අද (2005 වනවිට) ඝණ කිලෝමීටර් 220 දක්වා ඉහළ නැග ඇතැයි සඳහන් කරනවා.

පසුගිය විසි වසර තුළ ග්‍රීන්ලන්තය පිහිටා ඇති උත්තර අර්ධගෝලයේ වායුගෝලීය උණුසුම සෙන්ටිග්‍රේඩ් අංශක තුනකින් වැඩිවී තිබෙනවා. පර්යේෂකයන් පවසන පරිද්දට ග්‍රීන්ලන්තයේ පිහිටි අයිස් තට්ටු වර්ග කිලෝමීටර් මිලියන 1.7 ක විශාලත්වයකින් යුක්තවන අතර එහි ඝනකම කිලෝමීටර් තුනක්. මෙම අයිස් ප්‍රමාණය අත්ලන්තික් සාගරයට එක්වීමෙන් පසු යටවී යන ගොඩබිම් ප්‍රදේශයන් ගැන නම් තවමත් විද්‍යාඥයන් ගණන් බලා නැහැ. මෙම තත්ත්වයට කෙසේවත් මුහුණදිය නොහැකි බැව් පමණක් නාසා විද්‍යාඥයෙක් බී.බී.සී. පුවත් සේවයට පවසා තිබුණා.

කසුන් අංජන ඉරුගල්බණ්ඩාර